10 ශ්‍රේණිය

# පළමු ඒකකය
# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
# Information & Communication Technology

II කොටස

1. තම බැංකු ගිණුමෙන් මුදල් ආපසු ගැනීම සඳහා ගීතා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) භාවිතා කරයි. ඇය පළමුව යන්ත්‍රයට කාඩ්පත ඇතුළත් කර රහස් අංකය ලබා දෙයි. අනතුරුව ඇය තමන්ට ආපසු ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඇතුළත් කරයි. පද්ධතිය මගින් ඇයගේ ගිණුමෙහි ශේෂය සොයාබලා, ඇය ආපසු ගැනීමට ඉල්ලා ඇති මුදලට වඩා ගිණුමෙහි ශේෂය වැඩි බැවින් ඉල්ලා ඇති මුදල යන්ත්‍රයෙන් ලබා දෙයි. මීට සමගාමීව පද්ධතිය මගින් ගිණුමෙහි තිබූ ශේෂයෙන් යන්ත්‍රය මගින් ගෙවන ලද මුදල අඩුකර ගිණුමෙහි ශේෂය යාවත්කාලීන කරයි.

   ඉහත ක්‍රියාදාමයට අදාළව ආදානය, ක්‍රියාවලිය සහ ප්‍රතිදානය සඳහා උදාහරණය බැගින් ලියන්න. (2016)

2. මූලස්ථාන කාර්යාලය කොළඹ ද ශාඛා මහනුවර, මාතර සහ යාපනය යන නගරවල ද ඇති එක්තරා සමාගමක් තම ශාඛා කළමණාකරුවන්ගේ මාසික රැස්වීම වීඩියෝ සම්මන්ත්‍රණ (Video Conferencing) තාක්ෂණය උපයෝගී කර ගනිමින් පැවැත්වීමට තීරණය කරන ලදී. (2016)

   A. වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය උපයෝගී කර ගැනීමෙන් සමාගමට ලැබෙන එක් වාසියක් ලියා දක්වන්න.
   B. වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය උපයෝගී කර ගැනීම නිසා මෙම සමාගමට මුහුණදීමට සිදු විය හැකි එක් ගැටලුවක් ලියා දක්වන්න.
   C. ඉහත සමාගම දැනට තම සේවකයන් සමග සන්නිවේදන කටයුතු සඳහා මුද්‍රිත ලිපි සහ කෙටි ලිපි (Memos) භාවිත කරයි. සේවකයන් සමග සන්නිවේදන කටයුතු සඳහා වර්තමානයේදී භාවිතා කරන එම ක්‍රම වෙනුවට නවීන තාක්ෂණය භාවිත කිරීමට සමාගම තීරණය කරන ලදී. ඒ සඳහා සුදුසු පණිවිඩ යැවීමේ තාක්ෂණයක් නිර්දේශ කරන්න.
   D. වීඩියෝ සම්මන්ත්‍රණ සහ ඉහත [C] හි ඔබගේ නිර්දේශයට අමතරව, මෙම සමාගමට තම සේවකයන් සමග නවීන තාක්ෂණය භාවිතයෙන් සන්නිවේදන කටයුතු කළ හැකි වෙනත් ක්‍රම දෙකක් සඳහන් කරන්න.

3. අභ්‍යාස පොත් තුනක් සහ පෑන් දෙකක් මිලදී ගැනීමට සාමා පොත් සාප්පුවකට යයි. අදාළ අයිතම සොයාගත් පසු ඒවා කවුන්ටරය වෙත ගෙනයයි. අනතුරුව, වෙළෙඳ සහායක විසින් අයිතම වල අලවා ඇති තීරු කේත (Barcode) සාප්පුවෙහි ඇති තොරතුරු පද්ධතියට සුපිරික්සනු (Scan) ලැබේ. එක් එක් අයිතමයේ ප්‍රමාණ ද පද්ධතියට ඇතුළු කරනු ලැබේ. පද්ධතිය මගින් සෑම අයිතමයකම පිරිවැය සහ සියලු අයිතමවල මුළු පිරිවැය ගණනය කරනු ලැබේ. ඉන්පසුව, ගනුදෙනුව සඳහා බිල්පත මුද්‍රණය කරනු ලැබේ.

   ඉහත තොරතුරු පද්ධතියේ ආදාන, ක්‍රියාවලි සහ ප්‍රතිදාන සඳහා එක් නිදසුන බැගින් ලියා දක්වන්න. (2017)

4. කොළඹ කාලගුණ මධ්‍යස්ථානය මගින් එක් මසක දෛනික වර්ෂාපතන අගයන් වාර්තා කරගනු ලබයි. ඉහත සඳහන් කරන ලද දෛනික වර්ෂාපතන දත්ත සැකසීමෙන් (Processing) ලබාගත හැකි තොරතුරු (Information) සඳහා උදාහරණ දෙකක් ලියන්න. (2019)

5. ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු පහසු කිරීමට තම පාසලේ ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් [Learning Management System (LMS)] ආරම්භ කිරීමට විදුහල්පතිතුමියකට අවශ්‍ය වේ. භාවිතයට නොගත් නව පරිගණකයක් ඒ සඳහා යොදාගැනීමට අදහස් කෙරේ. මෙම පද්ධතිය හරහා ශිෂ්‍යයන්ට ලබාගත හැකි ප්‍රතිලාභය ලියා දක්වන්න. (2019)

6. කොළඹ කාර්යාලයක සිටින කළමණාකරුවකුට, යාපනය හා මාතර කාර්යාලවල සිටින කළමණාකරුවන් සමග වීඩියෝ සම්මන්ත්‍රණයක් අවශ්‍ය වේ. මෙම පහසුකම භාවිත කිරීම සඳහා එම ස්ථානවල තිබිය යුතු අවශ්‍යතා ලියා දක්වන්න. (2019)

7. ඔබ පාසලේ පොත්හල පරිගණක පාදක තොරතුරු පද්ධතියක් ඇසුරෙන් ක්‍රියාත්මක වේ. සිසුවකු ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේදී ලිපිකරු විසින් සිසුවා මිලදී ගැනීමට අදහස් කරන එක් එක් අයිතමයේ අයිතම කේතය හා ප්‍රමාණය ඇතුළත් කරනු ලැබේ. අනතුරුව පද්ධතිය මගින් එක් එක් අයිතමයේ මුළු පිරිවැය හා සමස්ත බිලෙහි පිරිවැය ගණනය කරනු ලැබේ. ඉන්පසු පද්ධතිය මගින් අවසන් බිල්පත තිරය මත මුද්‍රණය කරනු ලැබේ. ඉහත සංසිද්ධිය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (2019)

   A. ආදානයක් (Input) ලියා දක්වන්න.
   B. සැකසීමක් (Process) ලියා දක්වන්න.
   C. ප්‍රතිදානයක් (Output) ලියා දක්වන්න.

8. පාසල් හා උසස් අධ්‍යාපනික ආයතන වල පරිපාලනය සඳහා ඉගෙනුම් කළමණාකරණ පද්ධති (LMS) යොදාගැනුම පොදු භාවිතයක්ව පවතී. ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් මගින් සිසුනට ලබාදෙන පහසුකම් දෙකක් ලියන්න. (2020)

ICT Tutorials HUB

9. නිමල් ඔහුගේ පුතුට මුදල් යැවීම සඳහා මාර්ගගත (Online) බැංකු පද්ධතියකට පුරණය (Logged) වේ. නිමල් ඔහුගේ පුතුගේ ගිණුම් අංකය සහ මාරු කළ යුතු මුදල් ප්‍රමාණය ඇතුළත් කරනු ලබයි. මෙම ගනුදෙනුව අනුමත කිරීම සඳහා පද්ධතිය මගින් පුද්ගල හැඳුනුම් අංකයක් (PIN) ඉල්ලා සිටියි. PIN අංකය තහවුරු කරගත් පසු, පද්ධතිය සියලු මුදල් මාරු කිරීමේ විස්තර පෙන්වනු ලබන අතර, නිමල්ගෙන් අවසන් අනුමත කිරීම (OK) ලබාගනී. සාර්ථක ගනුදෙනුවක අවසානයේදී, නිමල්ට e-රිසිට්පතක් ලැබේ.
ඉහත සංසිද්ධියට සඳහා, ආදාන දෙකක්, සැකසුම් දෙකක් සහ ප්‍රතිදාන දෙකක් ලියා දක්වන්න. (2020)

10. එක්තරා පාසලක ගුරුවරු පරිගණක පද්ධතියකට සම්බන්ධ කර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතයෙන් පැමිණීම සටහන් කිරීමට අපේක්ෂා කරයි. මෙම පද්ධතිය මගින් මාසිකව පැමිණීමේ වාර්තාවක් ජනනය කරයි. ඉහත තොරතුරු පද්ධතියේ ආදානයක් සඳහා එක් උදාහරණයක් සහ ප්‍රතිදානයක් සඳහා එක් උදාහරණයක් ලියා දක්වන්න. (2021)

11. රෝගීන්ට ඇතිවන අපහසුතා අවම කිරීමට පරිගණකගත හමුවීම් වේලාවන් (appointment) නියමකරන (scheduling) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට රෝහලක බාහිර රෝගී අංශයක් (OPD) තීරණය කරයි. දහවල් 12 - ප.ව. 1 තෙක් ආහාර විවේකයක් සමගින් මෙම අංශය සෑම දිනකම පෙ.ව. 8 සිට ප.ව. 5 තෙක් රෝගීන්ට විවෘත ය. සෑම පැයක්ම විනාඩි 15 කාලච්ඡේද හතරකට බෙදා, එවැනි එක් කාලච්ඡේදයක් රෝගීන් තුන් දෙනෙක් සඳහා වෙන් කිරීමට මෙම අංශය සැලසුම් කරයි.
සිදුකළ සෑම හමුවීම් වේලා වෙන්කිරීමක් සඳහාම, යෝජිත පරිගණක පද්ධතියේ, තොරතුරු පහක් ආචය කෙරේ. රෝගියාගේ ජාතික හැඳුනුම්පත් අංකය, නම සහ දුරකථන අංකය ඒවායින් තුනකි. ඉතිරි තොරතුරු දෙක ලියා දක්වන්න. (2022)

12. A සිට D තෙක් ඇති ලේබල මගින් දක්වන විස්තර පහත දී ඇති ලැයිස්තුවේ නිවැරදි පද හා ගළපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් එයට ගැළපෙන පදයේ අංකය ලේබලය → පදයේ අංකය ආකාරයෙන් ලියා දක්වන්න. (2022)

| ලේබලය | විස්තරය |
|---|---|
| A | දුරස්ථ රෝගීන් ICT භාවිතයෙන් රෝහල් විශේෂඥ ඒකක සමග සම්බන්ධ වීම |
| B | ගුරුවරුන්ට/සිසුන්ට ඉගැන්වීමට/ඉගෙන ගැනීමට උදව් වන යෙදුමක් |
| C | ශරීරයේ අභ්‍යන්තර කොටස්වල සවිස්තරාත්මක රූප සටහන් ගොඩනැගීම |
| D | අන්තර්ජාලය හරහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා විකිණීම සහ විකුණුම් සම්පූර්ණ කිරීමට සංචිත (funds) සහ දත්ත හුවමාරුව |

ලැයිස්තුව : {1 - හෘද රෝග නිරගැන්වීම (Cardiac screening), 2 - ඊ-බැංකු (Electronic Banking), 3 - ඊ-වාණිජ්‍ය (Electronic commerce), 4 - ඉගෙනුම් කළමණාකරණ පද්ධතිය (LMS), 5 - චුම්බක අනුනාද අනුරූකරණය (MRI), 6 - දුරස්ථ සෞඛ්‍ය පුහුණුව (Medical Tele training), 7 - පාසල් කළමණාකරණ පද්ධතිය, 8 - දුරස්ථ සෞඛ්‍ය රැකවරණය (Telemedicine)}

ICT Tutorials HUB